**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**
**------------------------------**
**කළුතර දිස්ත්‍රික්කය**
**---------------**

1. ගණුදෙනු වාර්තාව

------------------------

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2021 පෙබරවාරි 08 දින ද විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2021 පෙබරවාරි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

2. අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br>(i) 134(1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපල සම්බන්ධයෙන් අළුතින් හඳුනාගන්නා ලද වරිපනම් කලාප වලින් වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කලයුතු වේ. | දියුණු කලයුතු ප්‍රදේශයක් බවට පත් කිරීමට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත මහ සභාවට ඉදිරිපත් කර සම්මත කර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ඉල්ලීම් ලිපි යොමු කර ඇත. |
| | (ii) 154 වගන්තිය | 1,522,191 | 2019 වර්ෂයේ ඉඩම් විකිණීම් 04 කින් එකී ආයතන විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තා පදනම් කර ගෙන සියයට එකක බදු අයකරගෙන තිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කලයුතු වේ. | ඉඩම් සඳහා වාරික වශයෙන් ගෙවීම් නිසා ඔප්පු ඉදිරිපත් කිරීම් සිදු කරන්නේ සියළු මුදල් ගෙවීමෙන් පසු තක්සේරු වටිනාකමින් සියයට එකක බදු මුදල් අයකර වෙනසක් ඇති වුවහොත් පසුව එම දේපල විකුණු ආයතනයෙන් ලබා ගන්නා බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 160 වගන්තිය | - හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කලයුතු වේ. | ජේදය හා එකඟ වේ. |
| (ආ) | 1988 මැයි 17දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍ර ලේඛය | වරිපනම් වලට යටත් වන දේපල වසර 05 කට වරක් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ තක්සේරු කිරිමට සැලසුම් කලද, කෝවිඩ් වසංගතය නිසා එය සිදු කල නොහැකි වු හෙයින් ඉදිරියේදී අවසන් කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 ආදායම් පරිපාලනය

----------------------

#### 3.1.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 පෙබරවාරි 15 සිට 2018 දෙසැම්බර් 31 දක්වා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,965,000 | 7,432,006 | 7,961,950 | 763,470 | 5,119,625 | 5,385,655 | 4,358,182 | 1,303,224 |
| (ii) | කුලී | 2,224,000 | 3,855,391 | 3,741,038 | 148,043 | 2,372,125 | 1,578,887 | 1,506,539 | 72,348 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 401,000 | 410,000 | 410,000 | - | 236,250 | 532,200 | 532,200 | - |
| (iv) | වෙනත් ආදායම් | 93,649,000 | - | 46,653,125 | 46,995,875 | 46,064,375 | - | 30,832,444 | 15,231,931 |
| | | 102,239,000 | 11,697,397 | 58,766,113 | 47,907,388 | 53,792.375 | 7,496,742 | 37,229,365 | 16,607,503 |

3.1.2 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.36,666,700 ක් විය. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති ලැබීමට ඇති මුදල රු.131,047,610 ක් බව දන්වමි. |

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කළ යුතු වේ. | අයුර්වේද මධ්‍යස්ථානයේ කෙටුම්පත් කිරීමට අදාල අතුරු ව්‍යවස්ථා විෂයභාර ඇමතිවරයාට යොමු කර ඇති බව දන්වමි. |
| (ආ) ක්‍රියාකාරි සැලස්ම<br>2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ආ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි සඳහා රු.මි.7.8 ක ප්‍රතිපාදනය, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ප්‍රතිපාදන ඇතුලත් කළ යුතු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය<br>2019 වර්ෂයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.21,793,371 ක පිරිවැයක් දරා තිබුණු | කසළ පිරිවැය අවම කර ගැනීම සඳහා කටයුතු කල යුතු අතර අතුරු | වියදම් අවම කිරීම සඳහා කසළ පොල, සත්ව ආහාර අලෙවිය හා |

| | | |
|---|---|---|
| අතර එකී වියදම් අවම කර ගැනීම සඳහා කසල බඳු පැනවීමක්ද සිදු කර නොතිබුණි. තවද කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි. | ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | ප්‍රතිචක්‍රිකරණය ආදියෙන් පිරිවැය ආවරණය කරන බව දන්වමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී තිරසර සංවර්ධන සැලැස්මක් පිලියෙල කර එහි අරමුණු 15 ක් ළඟාකර ගැනීම සඳහා 2020 වර්ෂය දක්වා සැලසුම් සකස් කර තිබුණ ද සභාවේ අයවැය ලේඛනය සැකසීමේදී තිරසර සංවර්ධන අරමුණු වලට අනුගතව කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු පදනම් කරගෙන අයවැය ලේඛනයේ ප්‍රතිපාදන ඇතුලත් කලයුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු සැලැස්මේ නොතිබුණ ද, පනතේ කාර්යයන් අනුව තිරසර සංවර්ධන අරමුණු ද බැඳී ඇති බව දන්වමි. |

4.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට ද්විතික මට්ටමේ පුරප්පාඩු 05ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 10 ක් පැවති අතර තාක්ෂණ නිලධාරි තනතුරක හා කළමනාකරණ සහකාර තනතුරක අතිරික්තයක් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ ගැනිමට කටයුතු කල යුතු වේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

4 .3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉරිදා සතිපොළ බදුදීම | | |
| ගිවිසුමේ 07 වෙනි වගන්තිය ප්‍රකාරව පරිශ්‍රයට අදාල මාසික ජල හා විදුලි බිල්පත් ගෙවීම බදුගැණුම්කරු විසින් සිදු කල යුතු වුවත්, 2019 අගෝස්තු සිට දෙසැම්බර් මාසය දක්වා සති පොලේ ජල බිල්පත් පියවීම වෙනුවෙන් රු.162,911 ක් හා විදුලි බිල්පත් පියවීම වෙනුවෙන් රු.10,167 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ගිවිසුමේ වගන්තිය ප්‍රකාරව බදුගැණුම්කරු විසින් ගෙවීම් කලයුතු වේ. | ඇස්තමේන්තුවක් සකස් කර එය බදුකරුගේ තැන්පත් මුදලින් අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) වාහන භාවිතය

-------------------

| | | |
|---|---|---|
| සභාව සතුව යතුරුපැදි 06 න් 05 ක් සභා සේවකයින් වෙත ලබා දී ඇති අතර ඒ සඳහා ඉන්ධන සභාවෙන් නිකුත් නොකරන නමුත් සියළු අළුත්වැඩියා , සේවා කටයුතු , ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනිම සභා අරමුදලින් සිදු කර තිබුණි. තවද මෙම යතුරුපැදි රාජකාරි කාලයෙන් පසු සභාවේ ගාල් නොකර ඔවුන්ගේ පෞද්ගලික භාරයේ තබාගෙන තිබුණි. | සභාව සතු යතුරුපැදි ආරක්ෂිතව සභාවේ ගාල් කලයුතු වේ. | සභාවේ ගාල් කිරීම සඳහා සේවකයින්ට දැනුම් දී ඇති බව දන්වමි. |

(ඇ) රයිගම කොතලාවල කන්ද පහල මීගහවත්තේ ඉදිකර ඇති බහු කාර්ය ගොඩනැගිල්ල

------------------------------------------------------------

| | | |
|---|---|---|
| මහල් දෙකකින් යුතු මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 06 කට ආසන්න කාලයක් ගතවී ඇති නමුත් ජල පහසුකම් සපයා නොතිබුණි. ගොඩනැගිල්ලේ වහලයේ කුමේර බැඳ නොතිබීම හේතුවෙන් ඉහල මහල වැසි වතුර වැටීමෙන් ජරාජීර්ණ වී තිබු අතර වහලයේ ලී ද වැස්සට නිරාවරණය වීම නිසා කෙටි කලකින් දිරාපත් වීමේ අවදානමක් පැවතුණි. ගොඩනැගිල්ලෙහි යතුරු සභාව සතුව නොතිබීම හේතුවෙන් විවෘත කිරිමට නොහැකි වු අතර ගොඩනැගිලි <u>භූමිය</u> වල් බිහිවී තිබුණි. 2019 වර්ෂයේදී රු.289,190 ක් වැය කර අළුත්වැඩියාවක්ද සිදු කර තිබු නමුත් වසර 06 කට ආසන්න කාලයක් සම්පූර්ණයෙන් භාවිතයට ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් අවශ්‍ය පහසුකම් සපයා භාවිතයට ගතයුතු වේ. | දැනට මෙම ගොඩනැගිල්ලේ භාවිතයට ගෙන ඇති අතර වැඩ අවසන් කර සභාවට භාරදී නොතිබුණි. |

(ඇ) පුස්තකාල පොත් අස්ථානගත වීම

--------------------------------------

| | | |
|---|---|---|
| 2018 වර්ෂයට අදාල සමීක්ෂණයේදී ඥාණ ප්‍රදීප පුස්තකාලයේ අස්ථානගත වු රු.76,785 ක් වු පොත් 438 ක වටිනාකම කපා හැරීමට සභා තිරණයක් ගෙන තිබුණද එකි පොත් අස්ථානගතවීම සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් සිදුකර වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද පුස්තකාලයේ තිබෙන භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | පරික්ෂණයක් පවත්වා වගකිව යුත්තන් හඳුනාගත යුතු වේ. ඒ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කලයුතු වේ. | මේ සඳහා විමර්ශනයක් කර ඇති අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කිරිමට කටයුතු කරමි. |

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 14 කදී ප්‍රමාද වී අත්තිකාරම් පියවා තිබූ අතර 2019 ජනවාරි 01 දිනට රු.4,094,661 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් විය. | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කලයුතු වේ. | 2019 වර්ෂයේ අත්තිකාරම් පියවා ඇති අතර පෙර වර්ෂයේ නොපියවූ අත්තිකාරම් සඳහා උපලේඛන සොයා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) නිලධාරින් වෙත ලබාදුන් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබාදුන් අවස්ථා 17 ක් විය. | අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් ලබා නොදිය යුතුවේ. | වාහනයෙන් වාහනයට අත්තිකාරම් මුදල් ලබාගෙන අළුත්වැඩියා කිරීම නිසා එක් අත්තිකාරමක් පියවීමට පෙර අත්තිකාරම් ලබාගෙන ඇති බව දන්වමි. |

4.5 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභා බල ප්‍රදේශය තුල සුසානභූමි 25 ක් ඇති බව හඳුනාගෙන ඇතත් මැණුම් කටයුතු සිදුකර මායිම් හඳුනාගැනීමට හැකිවන පරිදි ආරක්ෂිත වැටවල් ඉදි කිරිමට හා සුසානභූමි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සුසානභූමි මිණුම් කර මායිම් හඳුනාගෙන මායිමු වැටවල් ඉදි කිරිම් හා පවරා ගැනීම් සිදු කල යුතු වේ. | සුසානභූමි මිණුම් කර පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) සභාව සතු ඉඩම් 25 ක් (අක්කර 04 රූඩ් 03 පර්චස් 30 ) කිසිදු කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | සභා සතු ඉඩම් භාවිතයට ගැනීමට කටයුතු කලයුතු වේ. | රුක් රෝපන ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට කටයුතු කරමි. |